# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 2 දරන ශ්‍රී සරණංකර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2008 ජනවාරි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 ජනවාරි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 7.00 යි.   තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2008 අංක 2 දරන ශ්‍රී සරණංකර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2008 ජනවාරි මස 23 වන දින]

එල්. ඩී.— ඕ. 21/2004

## ශ්‍රී සරණංකර සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී සරණංකර සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එහි සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ බද්දේගම පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 2 දරන ශ්‍රී සරණංකර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම, ආරම්භවන දින සිට හා ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී සරණංකර සංවර්ධන පදනමේ" තත්කාලීන සාමාජිකයන් හා මින් මතු මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී සරණංකර සංවර්ධන පදනම" යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී සරණංකර සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

3 සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී සරණංකර සංවර්ධන පදනමේ සාමාජික සාමාජිකාවන්ගේ ආර්ථික හා සමාජයීය මට්ටම වර්ධනය කිරීම;

2—P L 001610 - 2,750 (2006/11)

(ආ) ජනතාවගේ ජීවන තත්ත්වයන් වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම සහ ඔවුන් අතර සකසුරුවම්කම පිළිබඳ හැඟීම් හා ව්‍යවහාරයන් වැඩි දියුණු කිරීම;

(ඇ) ආබාධිත ජනතාවගේ ආර්ථික හා සමාජයීය තත්ත්වයන් වර්ධනය කිරීම;

(ඈ) පදනමේ සාමාජිකයන් ස්වයං රැකියා සඳහා දිරිගැන්වීම;

(ඉ) ළමා සහ වැඩිහිටි අයගේ අධ්‍යාපනික කටයුතු නංවාලීම සඳහා පාසල් සහ පුස්තකාල පිහිටුවා පවත්වා ගෙන යාම;

(ඊ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ යම් විදේශීය හෝ දේශීය ආයතනයක් හෝ සංවිධානයක් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම හෝ සහභාගි වීම;

(උ) ශ්‍රී ලංකාවෙහි හෝ යම් ස්ථානයක දී සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපන සහ දේශන සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබාගැනීමට ;

(ආ) මුදල් ණයට ගැනීමට හෝ දේශීය හෝ විදේශීය කවර හෝ ප්‍රභවයකින් මුදලින් හෝ ද්‍රව්‍යයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම ;

(ඈ) සංස්ථාවට අයත් යම් ඉඩමක, යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදි කිරීම හෝ ඉදි කිරීමට සැලැස්වීම ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හා නිකුත් කිරීමට සහ යම් බැංකුවක, ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පතු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට හා ඒ ගිණුම් වසා දැමීමට ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් පදනම විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන නීත්‍යානුකූල භාර කිසිවක් හෝ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ; සහ

(ඌ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙහි සේවක පිරිස් පුහුණු කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

5. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම තෝරා පත්කරගනු ලබන නිලධරයන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා 8 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව පැවරෙන්නේ ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ පදනමේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ ද, සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම පාලක සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

6. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ සාමාජිකයකු වූ හා ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කර ගනු ලබන තැනැත්තකුගේම නම ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) නාමලේඛනයෙහි පහත සඳහන් විස්තර, එනම්—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය හා රක්ෂාව;

(ආ) සාමාජිකයාගේ නම, නාමලේඛනයෙහි ඇතුළත් කරන ලද දිනය;

(ඇ) යම් සාමාජිකයකු, සාමාජිකයකු වීම අවසන් වූ දිනය ඇතුළත් විය යුතු ය.

සාමාජිකත්වය අහෝසිවීම.

7. සාමාජිකත්වය අහෝසි වීම පහත පරිදි විය හැකි ය:—

(අ) සාමාජිකයා මියයාම;

(ආ) ඉල්ලා අස්වීම;

(ඇ) සිහිවිකල්බවට පත්වීම;

(ඈ) ඇතැම් රීති කඩකිරීම.

සංස්ථාවේ රීති.

8. (1) සංස්ථාව විසින්, එහි යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය;

(ඈ) කළමනාකරණ මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නිල කාලය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ ඒ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන ස්ථාන, වේලාව සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, ඒවායේ න්‍යායපත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දි සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු;

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ පරිද්දෙන් එවැනි රැස්වීමක දි එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9**. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්ථවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ, සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අය විය යුතු ණය.

**10**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතුව තිබුණු සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලුම ණය සහ දායක මුදල් හා සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

**11.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක්; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**12.** මිලදී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය තිබෙන අතර, ඒ සියලු දේපළ සංස්ථාවේ 8 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් යම් ආකාරයකට බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ මුද්‍රාව, සභාපති සහ ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස, කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එසේ කරනු ලැබූ අත්සන් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

14. සංස්ථාව විසුරුවා හරින ලද විටක, සංස්ථාවේ සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර වූව ද දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය ආදායම හෝ දේපළ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදාදීම එහි රීති මගින් තහනම් කොට ඇත්තා වූ ද, වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේදැයි, සංස්ථාවේ සාමාජිකයන් විසින්, සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

15. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවූවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා